# රොබට් නොක්ස් සිරගත කළ ලැගුන්දෙනිය එළිමහන් සිර කඳවුරෙහි පිහිටීම භූගෝලීය ලක්ෂණ ඇසුරින් තහවුරු කිරීම

ඩී.එම්.නන්දනී දිසානායක*

ක්‍රිස්තු වර්ෂ 1658 සිට වසර 19ක් වැනි දීර්ඝ කාලසීමාවක් ශ්‍රී ලංකාද්වීපයෙහි සිරකරුවෙකු වශයෙන් ජීවත්වුණු බ්‍රිතාන්‍ය ජාතික රොබට් නොක්ස් දිවයිනෙහි විවිධ ප්‍රදේශ රැසක රඳවා තැබූ බව සඳහන් වේ. මෙම ස්වාධීන පර්යේෂණයෙහි අරමුණ වන්නේ රොබට් නොක්ස් සහ ඔහුගේ සගයින් සිව්දෙනෙකු සිරගතකොට තැබූ එම ලැගුන්දෙනිය එළිමහන් සිරකඳවුර භූවිද්‍යාත්මක සාධක පදනම් කරගනිමින් තහවුරු කිරීමයි. මෙම පර්යේෂණයෙහි අරමුණ සාධනය කරගැනීම සඳහා ප්‍රධාන මූලාශ්‍රය ලෙස උපයෝගී කරගනු ලැබුවේ ශ්‍රී ලංකාවේ අත්දැකීම් පාදක කොටගෙන ප්‍රකාශයට පත්කළ රොබට් නොක්ස්ගේ An Historical Relation of the Island Ceylon කෘතියේ සිංහල අනුවාදය වන එදා හෙළදිව කෘතියයි. සෙසු මූලාශ්‍ර වශයෙන් සමකාලීන උඩරට රාජධානිය පිළිබඳ තොරතුරු සපයාගත හැකි ලිඛිත මූලාශ්‍ර, පූර්ව පර්යේෂණ වාර්තා, ජනප්‍රවාද සහ පුරාවෘත, ක්ෂේත්‍ර අධ්‍යයනය යනාදී ක්‍රමවේද භාවිතා කරන ලදී.

ලැගුන්දෙනිය ග්‍රාමය මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩපළාත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කඳුකර ඉහළ කෝරලයට අයත් වේ. ගම්පොළ නගරයේ සිට සැතපුම් 6-7ක් පමණ දුරින් පිහිටා ඇත. එදා හෙළදිව කෘතියෙහි ''ලැගුම්දෙනියේ ගෙදර'' ලෙස දැක්වෙන 29 වැනි පරිච්ඡේදය මගින් මෙම ප්‍රදේශය පිළිබඳ සඳහන් කරයි. නොක්ස් පවසන්නේ මානා පඳුරුවලින් ගහණ කඳුකර ප්‍රදේශයක් වන මෙම කඳවුර ඔහුට ලංකාද්වීපයෙහි දක්නට ලැබුණු නිසරුම ස්ථානය වන බවයි. එසේම උඩුනුවර හා යටිනුවර අතරින් ගලායන සුන්දර මහවැලි නදිය මෙම ප්‍රදේශයට මැනවින් දර්ශනය වන බව ද පවසයි. ගමන් කිරිමට ඇත්තේ කුඩා අඩිපාරවල් ය. මෙම භූගෝලීය ලක්ෂණ වර්තමානයේ ද එසේ ම දැකගත හැකියි. මෙම භූමි ප්‍රදේශයෙහි දැකගත හැකි වූ සුවිශේෂී කාරණාවක් වන්නේ පස තිරුවාණා බහුල බොරළු අධික තත්වයකින් යුක්ත බවයි. ප්‍රදේශයේ නිසරුභාවයට එම කාරණය හේතුවන්නට ඇත. එසේම මෙම පර්යේෂණයේදී ගම්මානයේ ජනප්‍රවාදයක්ව පවතින නොක්ස්ට ආහාර ලබාදුන් බව සැලකෙන ''නාසින්දෙණිය'' නම් පැරණි නිවසක් හඳුනාගත හැකි විය. මෙම පර්යේෂණය මගින් මූලාශ්‍ර පරිශීලනය හරහා ලබාගත් භූගෝලීය ලක්ෂණ සහ පිහිටීම පිළිබඳ තොරතුරු ක්ෂේත්‍ර අධ්‍යයනය මගින් තහවුරු කරගැනීමට හැකියාව ලැබුණි. එම තොරතුරුවල නිරවද්‍යතාවය අනුව ක්‍රිස්තු වර්ෂ 1667 දී රොබට් නොක්ස් සහ ජෝන් ලව්ලන්ඩ් ඇතුළු පිරිස සිරගතකොට තැබූ එළිමහන් සිර කඳවුර වර්තමාන උඩපළාත කඳුකර ඉහළ කෝරලේ පිහිටි ලැගුන්දෙනිය ගම්මානය වන බව නිගමනය කළ හැකි ය.

ප්‍රමුඛ පද- රොබට් නොක්ස් , ලැගුන්දෙනිය , එළිමහන් සිරකඳවුර , එදා හෙළදිව , භූගෝලීය ලක්ෂණ

* පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය nandani.disanayaka1@gmail.com